ලක්බිම ඉරිදා සංග්‍රහය
http://www.lakbima.lk

විශ්වයම විචිත්‍රව

මන්දාකිණිය

පිටුව 31

2013 ජනවාරි 06 ඉරිදා

කැඩුම් බිඳුම් සුවකිරීමට ඖෂධ හා ආලේපන අවශ්‍ය නෑ

දේශීය කැඩුම් බිඳුම් වෛද්‍යවරුන් යැයි කියාගන්නා අයට බටහිර වෛද්‍යවරයෙකුගෙන් අභියෝගයක්



පුළුවන්නම් කලව අස්ථිය බිඳුණු අයකු සතියකින් ඇවිද්දවා පෙන්වන්න

■වෛද්‍ය ආනන්ද දිසානායක

මාර්ග අනතුරු වැඩිවීම සහ දියුණුවෙමින් පවතින ඉදිකිරීම් නිසා අප රටෙහි කැඩුම් බිඳුම් හෙවත් අස්ථි භග්න ඉහළයාම පුදුමයට කරුණක් නොවේ. එසේම රටෙහි වියපත් ජනතාවගේ සංඛ්‍යාව ඉහළ යාම "ඔස්ටියෝපොරෝසිස්" හෙවත් අස්ථි දුර්වලවීමේ රෝගයට බඳුන් වූ සංඛ්‍යාව ඉහළ යාමට එක් හේතුවකි. සුළු වැටීමකින් වුවද ඔවුහු අස්ථි බිඳීමට ලක්වෙති.

අස්ථි බිඳීම්වලට ලක්වූවන් බහුතරයක් අද දවසේ බටහිර වෛද්‍යක්‍රමය තෝරා ගනිති. තවත් පිරිසක් පිළිගත් ලියාපදිංචි දේශීය වෙදකම තෝරා ගනිති. තවත් කොටසක් නීති විරෝධීව ප්‍රතිකාර කරන පුද්ගලයන් වෙත ඇදීයති.

නමුත් නූතන බටහිර වික්‍රලාංග ශල්‍යකර්ම අද ඉතා දියුණු තත්ත්වයට පත්ව ඇත. රටෙහි සියලුම ප්‍රධාන රෝහල්වල වික්‍රලාංග ශල්‍ය වෛද්‍යවරු සේවය කරති. එබැවින් බටහිර වෙදකම කැඩුම් බිඳුම් සඳහා තෝරා ගැනීමට රෝගීනු කිසිසේත් බිය විය යුතු නැත.

අස්ථියකට දරාගත නොහැකි ආකාරයක බලයක් එම අස්ථිය මතට යෙදුනහොත් එය කැඩීමට ලක්වේ. කුඩා ළමුන්ගේ කැඩුණු අස්ථි බොහෝ විට කොළ පැහැති ශාක දණ්ඩක් නැවීමෙදී සිදුවන ආකාරයට කැඩීමට ලක්වන අතර වැඩිහිටියන්ගේ මෙන් සම්පූර්ණයෙන් කැබලිවලට වෙන් නොවේ.

අස්ථි කැඩීමක් ඇතිවූ විට එම අස්ථියට පමණක් නොව ඒ අවට ඇති රුධිර නාළ ස්නායු, මාංශපේශීන් වැනිදේවද යම් හානියක් ඇතිවේ. පිටතට නොපෙනුනද අස්ථි බිඳුම අවට රුධිර ගැලීමක්ද ඇතිවේ. අස්ථිය ළඟින් ගමන් ගන්නා විශාල රුධිර නාළයක් කැඩී ගියහොත් සමහර විට මුලු ගාත්‍රයටම රුධිර සැපයුම නතර වේ. මෙය ඉතාමත් භයානක තත්ත්වයකි.

අස්ථි කැඩීමක් සුවවන්නේ කෙසේද? යන්න අපි දැන් සලකා බලමු. අපගේ ශරීර සෑදී ඇත්තේ බාහිර පරිසරයෙන් වන උපද්‍රව නිසා ඇතිවන තුවාල තම සිරුර විසින්ම ප්‍රකෘති තත්ත්වයට පත්වන ආකාරයටය. උදාහරණයක් නම් ශල්‍යකර්මයකින් ඇතිවන තුවාලය මැහුම් දමා සති දෙකකින් පමණ සම්පූර්ණයෙන්ම සුව වේ. මේ සඳහා කිසිදු විශේෂිත බෙහෙතක් අවශ්‍ය නොවේ.

අස්ථි කැඩීම සඳහාද කිවයුත්තේ මෙයමය. කැඩුණු අස්ථි යම් ආකාරයකට ළංකර තැබුවහොත් ස්වභාවයෙන්ම එම අස්ථි කලකින් එකට සම්බන්ධ වේ. මේ සඳහා තැවීම්, පත්තුබැඳීම්, ආලේපන අවශ්‍ය නොවේ.

කුඩා ළමුන්ගේ අස්ථි කැඩීම් බොහෝ විට ඉතා ඉක්මනින්ම සුවවේ. නමුත් අස්ථි කැඩීම් සුවවීමට ගතවන කාලය වෙනත් හේතූන් නිසාද වෙනස්වේ. අස්ථිය කැඩුණු ස්ථානය, කැඩී ඇති ආකාරය කැඩුණු අස්ථිවලට ඇති රුධිර සැපයුම ආදි කරුණු මෙයින් සමහරකි.

කැඩුණු අස්ථි අග්‍රවලින් එකකට හෝ රුධිර සැපයුම නැතිවුවහොත් සුවවීම සිදුනොවේ. උකුල් සන්ධියෙහි අස්ථිය බිඳීමකදී මෙම තත්ත්වය ඇතිවීම නිසා එම සන්ධියෙහි කොටසක් කෘත්‍රිමව යෙදීමට පවා සිදුවේ.

කැඩුණු අස්ථි මාංශපේශීන්ගේ ක්‍රියාකාරිත්වය නිසා දෙපසට ඇදී හෝ ඇත්වී පවතින්නේ නම් සුවවීම සිදුනොවේ. එසේම කැඩුණු අස්ථි කැබලි අතර මාංශපේශීන් වැනි අස්ථි නොවන පටක සිර වී පවතී නම් ඒ තත්ත්වය යටතේද සුවවීම සිදුනොවේ.

කැඩුම් බිඳුම් සඳහා ප්‍රතිකාර කරන්නේ කෙසේද? ඒ සඳහා අප විසින් කළ යුත්තේ ස්වභාවයෙන්ම සිදුවන සුවවීමට අවශ්‍ය පසුබිම සකසාදීමයි. කැඩුණු අස්ථි සුවවීමට අග්‍ර දෘඪ ලෙස නොසෙල්වී තිබීම සැමවිටම අවශ්‍ය නොවේ. කොලර් අස්ථිය බිඳුණවිටදී හෝ උරගිසට තරමක් පහළින් බාහු අස්ථිය බිඳුනවිටදී ගාත්‍රය සති කීපයක් ගෙලෙහි එල්ලා තැබීම පමණක් සෑහේ. එහෙත් බොහෝ අස්ථි භග්න වීමේදී කැඩුණු අග්‍රවල පිහිටීම පිළිගත හැකි ස්ථානයන්හි රැඳී නොපවතී. එවැනි භග්න යම් මැදිහත්වීමකින් පිළිගත හැකි ආකාරයකට සැකසිය යුතුය. කැඩීම සිදුවී ඇත්තේ සන්ධියක පෘෂ්ඨයක් හරහා නම් හැකිතාක් දුරට නිවැරදිව එම පෘෂ්ඨයට අදාළ අස්ථි කැබලි එකට සම්බන්ධ කළ යුතුය. එසේ නැතහොත් කල්යාමේදී එම සන්ධි ගෙවීයාමට සහ ආතරයිටිස් තත්ත්වයට පත්විය හැක.

කැඩුණු අස්ථි අග්‍ර නිවැරදිව සැකසීම සඳහා ක්‍රම කීපයක් භාවිත කරනු ලැබේ. නිර්වින්දනය කර වෛද්‍යවරයා විසින් අවශ්‍ය ආකාරයට ඇදීමෙන් සහ නැවීමෙන් සැකසීම, කැඩුණු ගාත්‍රයට බර එල්ලා තැබීම, ශල්‍යකර්ම මගින් කැඩුණ අස්ථි නිවැරදිව සැකසීම මින් සමහරකි.

කුමන ආකාරයට සැකසුවද අස්ථි අග්‍ර නැවත වෙනස්වීම වැළැක්වීමටත් චලනයන් අවශ්‍ය ප්‍රමාණයට අඩුකිරීමටත් ක්‍රම යෙදිය යුතුය. "ප්ලාස්ටර් ඔප් පැරිස්" කොපුවක් යෙදීම එක් ක්‍රමයකි. බර එල්ලා තැබීම අද දවසේ භාවිතා කරන්නේ කුඩා දරුවන්ගේ ඌර්වාස්තිය හෙවත් කලව ඇටය බිඳුණ විටදී පමණි. ඒ ඔවුනගේ අස්ථි ඉතා කෙටි කලකින් සුව වන බැවිනි.

කැඩුණ අස්ථි අග්‍ර දෘඪ ලෝහ වලින් නිපදවූ පට්ටම් සහ ඇණ භාවිතයෙන් සවිකිරීම, අස්ථි අග්‍ර තුළට ලෝහ දඬු කාවද්දා සවිකිරීම අද වික්‍රලාංග ශල්‍ය ක්ෂේත්‍රයේ බහුලව සිදුවේ. මෙවැනි අභ්‍යන්තර ලෝහමය සවිකිරීම් නිසා ඉතා ඉක්මනින්ම රෝගියාට ප්‍රකෘති තත්ත්වයට පත්විය හැකිය. භග්න වූ අස්ථි කැබලි තුළට බාහුවට පිටතින් කම්බිකුරු ඇතුල් කර එම කුරු බාහිරයෙන් ලෝහ දණ්ඩක් මගින් සවිකර තැබීමද බොහෝ විට සිදුවේ. මෙම බාහිර සවිකිරීම අස්ථිය සම්බන්ධ වූ පසු ඉවත් කරනු ලැබේ. තුවාල සහිත කැපීම් සඳහා මෙම ක්‍රමය භාවිතා කරනු ලැබේ.

මෙවැනි නූතන ප්‍රතිකාර නිසා රෝගියාගේ සන්ධිවල චලන ඉතා ඉක්මනින්ම යථා තත්ත්වයට පත්වන අතර, තම වැඩකටයුතු හෝ රැකියාව ඉතා ඉක්මණින්ම ආරම්භ කළ හැක.

කැඩුම් බිඳුම් ප්‍රතිකාරවලට අමතරව බටහිර වික්‍රලාංග ශල්‍යකර්ම මගින් තවත් බෙහෝ දේ අද ශ්‍රී ලංකාව තුළ සිදුකරනු ලැබේ. ගෙවීගොස් අකර්මණ්‍ය වූ දණහිස් සහ උකුල් සන්ධි ඉවත්කොට කෘත්‍රිමව සෑදූ සන්ධි යෙදීම පැරණි කැඩීමක් නිසා හෝ උපතින්ම ඇතිවූ අස්ථි කෙටිවීමක් ඇතිවිට එම අස්ථිය දික් කිරීම සහ තරුණවියේ ඇතිවන කොඳු ඇට පෙළ ඇදවීම ශල්‍යකර්ම මගින් සුවකිරීම මින් සමහරකි.

අස්ථි කැඩීමකින් පසු සිදුකළ යුතු වැදගත්ම කාර්යය නම් භග්න වූ ගාත්‍රයෙහි ක්‍රියාකාරිත්වය නැවත ප්‍රකෘති තත්ත්වයට ගෙන ඒමයි. මෙය ප්‍රතිකාර පටන්ගත් දින සිටම කරගන යා යුතුය. නොසෙල්වා තබා නැති සියලුම සන්ධි චලනය කළ යුතුය.

මේ සඳහා හෙත භික්ෂුකයන් වෙත විශාල වගකීමක් පැවරේ. කැඩීමක් සිදුනොවූ අයෙකුගේ තත්ත්වයට නැවත රෝගියා ගෙන ආ යුතුය.

බටහිර කැඩුම් බිඳුම් වෛද්‍යක්‍රම මෙසේ ඉතා දියුණු තත්ත්වයක තිබියද කනගාටුවට කරුණ නම් වික්‍රලාංග ඒකකවලට පැමිණෙන රෝගීන්ගෙන් විශාල පිරිසක් සුදුසුකම් නොලත් පුද්ගලයින් වෙතින් ප්‍රතිකාර ලබාගැනීමට ගොස් සංකූලතාවයන්ට පත්වීමය. මෙවැනි බොහොමයක්ගේ කැඩුම් නියමාකාරයෙන් සකසා නැතිව අසාමාන්‍ය ලෙස බද්ධ වී ඇත. සන්ධිවල චලනයන් අඩුපණවී ඇත. සමහරුන්ගේ සන්ධි ආශ්‍රිත කැඩුම් නිසිලෙස සකසා නැතිවීමෙන් සන්ධිවී ගොස් ආතරයිටිස් තත්ත්වයට පත්ව ඇත. සමහරුන්ගේ අස්ථි කෙටිවී හෝ කරකැවී බද්ධවී ඇත. සමහර රෝගීන්ගේ සන්ධි සන්ධිවී ඒවා ප්‍රකෘති තත්ත්වයට පත්නොකොට තැබීමෙන් ඒවායෙහි ක්‍රියාකාරිත්වය සම්පූර්ණයෙන්ම අඩපණ වී ඇත.

ශ්‍රී ලංකාව තුළ රෝගීනට ප්‍රතිකාර කළ හැක්කේ පිළිගත් වෛද්‍ය සභාවක ලියාපදිංචි වී සිටින වෛද්‍යවරුන්ට පමණි. එහෙත් කැඩුම් බිඳුම් සඳහා මෙසේ නොවන බොහෝ පිරිසක් නීති විරෝධීව ප්‍රතිකාරවල යෙදී මුදල් උපයති. මොවුන් ශරීරයේ අස්ථි, සන්ධි සහ අනෙකුත් අවයවවල පිහිටීම සහ ඒවායේ ක්‍රියාකාරිත්වය ගැන කිසිදු දැනුමක් ලැබුවෝ නොවෙති.

කිසිදු ඖෂධයක් හෝ ආලේපනයක් නොමැතිව ස්වභාවයෙන් සුවවන කැඩුම් බිඳුම් සඳහා නොයෙක් ආකාරයේ ආලේපන ගල්වා ඔවිහු රෝගීන්ගෙන් විශාල මුදල් අයකරති. සමහරුන් කිසිම නිර්වින්දනයකින් තොරව අස්ථි සැකසීමට ගොස් රෝගීන්ව දරාගත නොහැකි වේදනාවන්ට ලක්කරති. සමහරුන් වේදනාව ඉවසාගත නොහැකිව මියගිය අවස්ථාද ඇත.

> කිසිදු ඖෂධයක් හෝ ආලේපනයක් නොමැතිව ස්වභාවයෙන් සුවවන කැඩුම් බිඳුම් සඳහා නොයෙක් ආකාරයේ ආලේපන ගල්වා ඔවිහු රෝගීන් ගෙන් විශාල මුදල් අය කරති. සමහරුන් කිසිම නිර්වින්දනයකින් තොරව අස්ථි සැකසීමට ගොස් රෝගීන්ව දරාගත නොහැකි වේදනාවන්ට ලක්කරති. සමහරුන් වේදනාව ඉවසාගත නොහැකිව මියගිය අවස්ථාද ඇත.

මෙවැනි පුද්ගලයන් වෙත රෝගීන් ගෙන්වා ගැනීමට ඔවුහු ක්‍රම කීපයක් අනුගමනය කරති. සුවවීම සඳහා කිසිම මැදිහත්වීමක් අනවශ්‍ය කැඩුම් සඳහා නොයෙක් ප්‍රතිකාර කර එය තමන් විසින් සුවකළ බව පැවසීම එක් ක්‍රමයකි. රෝහලකින් භග්නය නිවැරදිව සකසා ප්ලාස්ටර් යොදා ඇති රෝගීන්ගේ ප්ලාස්ටරය ඉවත්කිරීමට දින කීපයකට පෙර ඔවුන්ව ගෙන්වා බෙහෙත් ආලේපකර තමන් සුවකළ බව පැවසීම දෙවන ක්‍රමයයි. ආලේපන කරන විටදී නොයෙක් ආකාරයේ වහසි බස් දොඩමින් රෝගීන් මානසික වසඟයට ගැනීම ඊළඟ ක්‍රමයයි. පුවත්පත් මගින් ඔවුන්ගේ හැකියාවන් කියාපෑම ඊළඟ ක්‍රමයයි. බටහිර වෛද්‍යවරුන්ට මෙසේ තමන්ගේ දස්කම් ගැන දැන්වීම් පළකිරීම නීති විරෝධිය. නමුත් ඔවුනට එසේ නැත. මෙවැනි නොයෙකුත් හේතූන් මත රෝගීනු ඔවුන් වෙත ඇදී යයි.

මෙවැනි පුද්ගලයන්ට හැකිනම් කලව අස්ථිය සම්පූර්ණයෙන් කැඩුණ පුද්ගලයකු ඖෂධ මගින් හෝ ඇට උණුකර බද්ධකිරීමෙන් හෝ සතියක් ඇතුළත ආධාරයකින් තොරව ඇවිදීමට සලස්වන මෙන් මා අභියෝග කරමි.

මෙම තත්ත්වයට බටහිර වෛද්‍යවරුන්ද එක්තරා දුරකට වගකිව යුතුය. රෝගීන් දැනුවත් කිරීම ඔවුන් අතින් හරියාකාරව සිදුනොවේ. මෙවැනි පුද්ගලයින්ගේ අනිසි ප්‍රතිකාර නිසා රජයටද විශාල මුදලක් නිකරුණේ වැයවේ. මොවුනගේ මේ ක්‍රියාවන් පාලනය කිරීම සෞඛ්‍ය අමාත්‍යංශයේ සහ සියලු වෛද්‍ය සභාවල වගකීමක් ලෙස මම දකිමි.